# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/23 - 2020 මාර්තු මස 04 වැනි බදාදා - 2020.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : මහ/ඉ/අත්/CEB/385.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526/බී ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.කො. 9875 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1161 පමණ වූ පහත විස්තර කරන ඉඩම:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහ කුඹුර හෙවත් මිල්ලගහදෙණිය; ඉඩම් පරිහරණය: මුඩු බිම සහ අත්හරින ලද කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: යූ.ඩී.ජානක ප්‍රියන්ත, අංක 95, පරණ කැස්බෑව පාර, ගංගොඩවිල, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1161 ක් පමණ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 මාර්තු මස 28 වැනි දින පෙ.ව. 9.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020 මාර්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ඒවායේ උධෘත හා අනෙකුත් ලියවිලි පරීක්ෂණයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම්.එම්.කේ.දිල්රුක්ෂි වල්පොල,
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරි,
මහරගම.

2020 මාර්තු මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම.

03 - 743